# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 අප්‍රේල් / මැයි**

**මානවශාස්ත්‍ර පීඨය**

**බෞද්ධ දර්ශනය - BUPH. E 1025**

**මූලාශ්‍රය අධ්‍යයනය හා ආදි බෞද්ධ නිකාය**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

---

01. බුදුන් වදාළ ශීල ශික්ෂාව බාහිර සංවරය මෙන්ම ආධ්‍යාත්මික සංවරය ද ඇති කරන ආකාරය සාමඤ්ඤඵල සූත්‍රය ඇසුරින් විමර්ශනය කරන්න.

02. සිත දියුණු කිරීම හා එහි ප්‍රායෝගික ප්‍රතිඵල පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

03. වර්තමාන සමාජ පරිසරය කෙරෙහි ද අවධානය යොමු කරමින් මානව චින්තනය හා ක්‍රියාකාරකම් තුළින් විවිධ සමාජ ගැටුම් හටගන්නා ආකාරය මහානිදාන සූත්‍රය අනුව පරීක්ෂා කරන්න.

04. බුදුදහම අනුව ලෞකික ඉන්ද්‍රිය ඥාණය, එහි ප්‍රභවය හා සය වැදෑරුම් ප්‍රභේද පිළිබඳ මධුපිණ්ඩික සූත්‍රාගත විවරණය කුමක්දැයි පෙන්වා දෙන්න.

05. දුක පිළිබඳ චතුෂ්කෝටික මතවාද පැහැදිලි කරමින්, බුද්ධ දේශිත පටිච්චසමුප්පාදයේ ඒ සියල්ල බැහැර කරන ආකාරය අචේලකස්සප සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

06. නිකාය භේදයට තුඩුදුන් විවිධ හේතු පාලි හා සංස්කෘත මූලාශ්‍රය අනුව විමසුමට ලක්කරන්න.

07. ථෙරවාදය තුළ භික්ෂු විනය පිළිබඳව පැනෙන දැඩි අවධානය අදාළ ඓතිහාසික මූලාශ්‍රය ඇසුරින් විමර්ශනය කරන්න.

08. මහා සංඝිකයන්ගේ ලෝකෝත්තරවාදී බුද්ධ සංකල්පය පාලි නිකායාගත වාර්තා සමග තුළනාත්මකව පරීක්ෂා කරන්න.

09. සෞත්‍රාන්තිකයන්ගේ ක්ෂණවාදය පිළිබඳ මූලික විවරණයක් කරන්න.

10. පහත දැක්වෙන මාතෘකාවලින් <u>දෙකකට</u> ප්‍රමාණවත් විවරණ සපයන්න.

1. අමරාවික්ඛෙපවාදය
2. පටිච්චසමුප්පාදයේ අතිරේක අරමුණු
3. සර්වාස්තිවාදීන්ගේ ධර්මවාදය
4. ආදිබුද්ධදහම හා පුද්ගලවාදය

*************************